වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

--------------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ

--------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 22 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබු අතර ඉකුත් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වු විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශිය සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකුලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වු මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශ පිළිබඳවා අදහස් දැක්විම.

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌණතා.

---------------------------

(i.) ගිණුම් ප්‍රකාශවල නිරික්ෂණය වු ඌනතා ආදායම් සහ බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | ආදායම් | | බැරකම් | |
| --- | --- | --- | --- | --- |
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 02 | 21,200 | 01 | 339,915 |
| වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 2,409,262 |
| අත්හැරීම් | - | - | 01 | 2,795,977 |

(ii) පුනරුත්ථාපන හා යළිගොඩනැගීමේ අධිකාරිය (උතුර) විසින් 2009 වර්ෂයේදී සභාවට පරික්ෂා කරන ලද අංක ඉසුසු 253-5122 දරන පික්අප් රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට නොගැනීම හේතුවෙන් වාහන වටිනාකම ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම

විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිකම නිසා වටිනාකම රු.65,387,028 ක් වූ ගණුදෙනු විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| **මුදල් රෙගුලාසි** | | |
| අංක 234 | - | හය මසක කාල පරිච්ඡේදය ඉක්ම වූ මුදල් නොවූ රු.11,608 ක් සඳහා වූ චෙක්පත් හයක් පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු නොකර මිශ්‍ර තැන්පතු ගිණුමට ඇතුලත් කර තිබුණි. |
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බද්ද | - | 2010 සහ 2011 වර්ෂ තුලදී අයකරගත් රු.65,249 ක් වූ එකතු කළ අගය මත වූ බදු මුදල් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකොට විවිධ තැන්පතු ගිණුමට ඇතුලත් කර තිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.56,817 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.829,097 ක් විය.

### 2.2 මුල්‍ය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල නොකර තිබූ නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.27,677,101 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.34,743,840 ක වෙනසක් ද විගණනයේදි නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම් |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 775 | 625 | 5,388 |
| (ii) බදු කුලි | 7,455 | 7,823 | 126 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,633 | 2,696 | 73 |
| (iv) වෙනත් ආදායම් | 41,308 | 13,351 | 37,412 |

2.3.2 ආදායම් නැතිවීම

රු.450,101 ක් සඳහා වූ පුත්තූරු ගවමස් වෙළඳපල සඳහා වූ ටෙන්ඩරය ප්‍රාදේශිය සභා රීති හා රෙගුලාසි වල සඳහන් නොවන අවශතාවයක් වූ පූර්ව පළපුරුද්ද නොමැතිකම මත සභාපති විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. පසුව රු.196,000 ක් සඳහා වූ වෙනත් ටෙන්ඩර්කරුවෙකු තෝරා ගැනිම නිසා රු.254,101 ක ආදායම් පාඩුවක් සභාවට සිදු වි තිබුණි.

2.3.3 ආදායම් එකතු කිරිම

(i.) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා රු.5,591,198 ක් වූ වරිපනම් සහ බදු, බදු කුලී සහ බලපත්‍ර ගාස්තු අයකර ගැනිම සඳහා නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii.) වසර 10 කට අධික කාලයක් තිස්සේ දේපල යලි ඇගයිමක් සිදුකර නොතිබිම නිසා වරිපනම් සහ බදු ආදායම් පාඩුවි තිබුණි.

2.3.4 උසාවි දඩ මුදල්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.756,834 ක් වූ උසාවි දඩ මුදල් ලැබිය යුතු මුදල් හා ආදායම් වශයෙන් ගිනුම්ගත කර තිබූ නමුත් ඒවා ලබා ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.5 මුද්දර ගාස්තු

-----------------

2006, 2007, 2010, 2011, 2012 සහ 2013 කාල පරිච්ඡේද සඳහා රු.88,303,605 ක් වූ මුද්දර ගාස්තු වශයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබා ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

අක්‍රිය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------

සභාවට අයත් වාහන තුනක් අක්‍රියව පැවතිණි.

2.5 භාණ්ඩ සමික්ෂණ වාර්තා

-----------------------------

භාණ්ඩ සමික්ෂණ වාර්තා තොග ලේඛන සමග සැසඳීමේදි අයිතම 3 කට අදාලව අතිරික්තයක් ද අයිතම 14 කට අදාලව ඌනතාවයක් ද පෙන්නුම් කෙරිණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

කාර්යයන් වැඩිදියුණු කිරිම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් 2010 වර්ෂය තුලදි ප්‍රදානය කරන ලද රු.240,674 ක මුදලක් භාවිතයෙන් තොරව මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

ප්‍රාග්ධන වැඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනිම සඳහා සභාව විසින් රු.4,550,000 ක් වෙන්කර තිබු නමුත් එම කටයුතු කිසිවක් ඉටුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම

(ආ) අයවැය

(ඇ) වාහන උපයෝජනය

(ඈ) ප්‍රාග්ධන වැඩ

(ඉ) අත්තිකාරම්